# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2283/15 - 2022 ජුනි මස 06 වැනි සඳුදා - 2022.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය: KDS/PDB/4/3/2/19.*
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/12/2018/WS/262.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ අංක 631 ගිරාකඩුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගිරාකඩුව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අංක මු.පි.මහ 7170 හා 2022.04.19 දිනැති පිඹුරේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0038 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක :

**කැබලි අංක 01**

ඉඩමේ නම:-; හිමිකම් කියන්නා : රජය; ප්‍රමාණය: හෙක්: 0.0009.

*උතුරට* : එම්. එච්. එම්. ටී. බී. හේරත් හිමිකම් කියන හෙලේහේන සහ මාර්ග (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය); *නැගෙනහිරට* : මාර්ග (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය); *දකුණට* : මාර්ග (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය); බටහිරට : ටී. ජී. කේ. මැණිකේ හිමිකම් කියන හෙලේහේන සහ කැබලි අංක 2.

**කැබලි අංක 02**

ඉඩමේ නම : හෙලේහේන; හිමිකම් කියන්නා : රජය; ප්‍රමාණය: හෙක්: 0.0029.

*උතුරට* : එම්. එච්. එම්. ටී. බී. හේරත් හිමිකම් කියන හෙලේහේන; *නැගෙනහිරට* : මාර්ග (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය) සහ කැබලි අංක 1; *දකුණට* : ටී. ජී. කේ. මැණිකේ හිමිකම් කියන හෙලේහේන සහ එම්. එච්. එම්. ටී. බී. හේරත් හිමිකම් කියන හෙලේහේන; බටහිරට : එම්. එච්. එම්. ටී. බී. හේරත් හිමිකම් කියන හෙලේහේන.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 අගෝස්තු මස 01 වැනි දින පෙ.ව. 10.00 ට පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022 ජූලි මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී

1A - G 36899 – 16 (2022/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

**ඩබ්. එම්. ටී. ඩී. කේ. වීරකෝන්,**
ප්‍රාදේශීය ලේකම්,
පාතදුම්බර.

2022 මැයි මස 30 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06-0069